# පරීක්ෂක වාර්තාව

AA3 විභාගය - ජූලි 2019

## (AA32) කළමනාකරණ ගිණුම්කරණය හා මූල්‍ය

(Management Accounting and Finance)

---

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විතය. මුළු ලකුණු 100 කි,

1. **A** කොටසට අනිවාර්ය ප්‍රශ්න 4 ක් ඇතුලත්ය. ලකුණු 20 කි - එකකට **ලකුණු 05** බැගිනි.
2. **B** කොටසට අනිවාර්ය ප්‍රශ්න 3 ක් ඇතුලත්ය. ලකුණු 30 කි - එකකට **ලකුණු** 10 බැගිනි.
3. **C** කොටසට අනිවාර්ය ප්‍රශ්න 2 ක් ඇතුලත්ය. ලකුණු 50 කි - එකකට **ලකුණු** 25 බැගිනි.

**පොදු නිරීක්ෂණ:**

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සාමාන්‍ය විය. විශේෂයෙන් ප්‍රශ්න අංක 05, 06, 07, 08 සහ 09 සඳහා අයදුම්කරුවන් සතුටුදායක ලෙස ලකුණු ලබා තිබුණි. කෙසේවෙතත්, අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්න අංක 01 සිට 04 දක්වා වූ ප්‍රශ්නවලට වසා අඩු කාර්යසාධනයක් පෙන්නුම්කර තිබුණේය.

**කොටස් අනුව කාර්යසාධනය:**

**A කොටස** සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.

**B කොටස** සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය.

**C කොටස** සඳහා සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය.

---

## A කොටස

### ප්‍රශ්න අංක 01

එකිනෙකට උදාහරණ දෙමින් ඉතුරුම් සහ ආයෝජන සංකල්ප අතර වෙනස මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබේ. මෙය සරල ප්‍රශ්නයක් වුවද ඇතැම් අයදුම්කරුවන් වෙනස ඉස්මතු කර දක්වා නොතිබූ අතර, වචන දෙකේ තනිතේරුම් මත පදනම්ව පොදුකරණය කළ උත්තර සපයා තිබුණි. ඔවුන් ස්ව-අධ්‍යයන පාඨමාලා පොතට, පසුගිය ප්‍රශ්නවලට, යෝජිත උත්තර ආදියට යොමුවී නොතිබූ බවද පෙනුණි. සීමිත අයදුම්කරුවන් පිරිසක් නිවැරදි උත්තර ලියා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණේය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

**පරීක්ෂක යෝජනා:**

ස්ව-අධ්‍යයන පොතේ අදාල පරිච්ඡේදය නිසිලෙස කියවීම නිර්දේශ කෙරේ.

## ප්‍රශ්න අංක 02

ප්‍රතිපෝෂණ පාලනය සහ පෙරපෝෂණ පාලනය අතර වෙනස සහ ප්‍රතිපෝෂණ පාලනයේ වාසි පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත. නිවැරදි උත්තර සපයා ඉහළ ලකුණු ලබා ඇත්තේ ඉතාමත් සුළු අයදුම්කරුවන් පිරිසකි. අනෙකුත් අයට මේ පාලනයන් දෙක වෙන්කර ගැනීමේ දුෂ්කරතාවයක් තිබී ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

**පරීක්ෂක යෝජනා:**

- නිසිලෙස ස්ව-අධ්‍යයන පොත පරිශීලනය කරන්න.
- ඉකුත් විභාගවල සමාන ස්වරූපයේ ප්‍රශ්න පුරුදු පුහුණු විය යුතුය.

## ප්‍රශ්න අංක 03

වෙළෙඳ ලැබිය යුතු මුදල් එකතුකර ගැනීමේ කාල ගණනය (a) **කොටසින්ද,** එම කාලය වැඩිදියුණු කර ගැනීම සඳහා උපාය මාර්ග (b) **කොටසින්ද** මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබේ. අයදුම්කරුවන්ගෙන් බහුතරය නිවැරදි සූත්‍රය ලියා කාලය නිවැරදිව ගණනය කර තිබුණි. කෙසේවෙතත්, අයදුම්කරුවන් බොහොමයකට, නිවැරදිව ණයට විකුණුම් ගණනය කළ නොහැකිව තිබූ අතර, විකුණුම් ලෙස විකුණුම් පිරිවැය ගෙන තිබූ බව පෙනී ගියේය.

අයදුම්කරුවන් බොහොමයක් (b) **කොටසට** නිසි උත්තර ලියා තිබුණේ නැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

**පරීක්ෂක යෝජනා:**

- උත්තර සැපයීමට පෙර ප්‍රශ්නය හොඳින් කියවන්න.
- ඉකුත් විභාගවල සමාන ස්වරූපයේ ප්‍රශ්න පුරුදු පුහුණු විය යුතුය.
- නිසිලෙස ස්ව-අධ්‍යයන පොත පරිශීලනය කරන්න.

## ප්‍රශ්න අංක 04

පිළිගෙවුම් කාලය ගණනය කිරීම පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත. මෙය සරල ඍජු ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නයට උත්තර ලියූ බොහොමයක් අයදුම්කරුවන් සම්පූර්ණ ලකුණු ලබා ගත්හ. කෙසේවෙතත්, සමහර අයදුම්කරුවන් මුදල් ගලාඒම්වලට ක්ෂය ගලපා ඊට පසුව පිළිගෙවුම් කාලය ගණනය කර තිබුණේය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

**පරීක්ෂක යෝජනා:**

පසුගිය විභාග ප්‍රශ්නවලට උත්තර ලියා පුරුදු පුහුණු වන්න.

## <u>B කොටස</u>

### ප්‍රශ්න අංක 05

පරිපූර්ණ තොරතුරු නොමැතිව උපක්‍රම 3 ක අපේක්ෂිත අගය ගණනය කිරීම සහ ඇගයීම මෙම ප්‍රශ්නයේ (a) **කොටසින්ද, සීමාසහිත WB සමාගම** ඉහත කරුණ ගැන පර්යේෂණ කරන සමාගමේ නිර්දේශය අනුව එහි සේවාව ලබාගත යුතුද යන්න ගණනය කිරීම් සහිතව හඳුනා දැක්වීම **(b) කොටසින්ද,** මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාවට ලක්කොට තිබේ. අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු ගණනක් මෙම ප්‍රශ්නයේ **(a) කොටස** සඳහා හොඳින් උත්තර ලියා තිබුණේය. කෙසේවෙතත් සමහර අයදුම්කරුවන් එක් එක් උපක්‍රමය අනුව මුළු අපේක්ෂිත අගය ගණනය කර නොතිබූ අතර, වඩාත් හොඳ උපක්‍රමය හඳුනා දක්වා නොතිබුණි. සමහර අයදුම්කරුවන් පෙරවැඩ (කටුවැඩ) පෙන්වා තිබුණේ නැත. අයදුම්කරුවන් බහුතරය **(b) කොටසට** උත්තර ලියා තිබුණේ නැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

**පරීක්ෂක යෝජනා:**

- පසුගිය ප්‍රශ්න පත්‍රවලට උත්තර ලියා පුරුදු පුහුණු වන්න.
- නිසිලෙස ස්ව-අධ්‍යයන පොත පරිශීලනය කරන්න.
- සියලුම පෙරවැඩ පැහැදිලිව පෙන්විය යුතුය.

### ප්‍රශ්න අංක 06

ස්ථර තුනේ අයවැයක් පිළියෙල කිරීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය කර තිබුණි. සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් ආදායම, රියැදුරු කොමිස් මුදල් සහ ස්ථාවර රියැදුරු වැටුප් නිවැරදිව ගණනය කර තිබුණද, මෙම කාරණා තුනටම උද්ධමනය අදාල කර ගැනීමට අපොහොසත් වී ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

**පරීක්ෂක යෝජනා:**

- පසුගිය ප්‍රශ්න පත්‍රවලට උත්තර ලියා පුරුදු පුහුණු වන්න.
- නිසිලෙස ස්ව-අධ්‍යයන පොත පරිශීලනය කරන්න.

### ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්** ප්‍රාග්ධන ප්‍රභවයන් ගණනය කිරීම පිළිබඳ දැනුමද, **(b) කොටසින්** ස්කන්ධ ප්‍රාග්ධනයට වඩා ණය ප්‍රාග්ධනය නිකුත් කිරීමේ වාසි පිළිබඳ දැනුමද පරීක්ෂාවට ලක්කර තිබේ.

අයදුම්කරුවන්ගෙන් සුළු පිරිසක් ගණනය කිරීම් නිවැරදිව සිදුකර සම්පූර්ණ ලකුණු ලබා තිබුණේය.

සමහර අයදුම්කරුවන් පහත දැක්වෙන වැරදි සිදුකර තිබුණි:

(1) නිවැරදි සූත්‍ර යොදා නොගැනීම.

(2) සාමාන්‍ය කොටස් පිරිවැය ගණනය කිරීමේදී ලාභාංශ වර්ධන මොඩියුල සූත්‍රය සැලකිල්ලට ගෙන නොතිබීම.

(3) බරතැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය ගණනයේදී ණය ප්‍රාග්ධනයෙන් වෙළෙඳපල මිල සැලකිල්ලට නොගැනීම.

(4) ප්‍රාග්ධන පිරිවැය ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ නොකිරීම.

(5) **(b) කොටස** සඳහා ණය ප්‍රාග්ධන නිකුත් කිරීමේ වාසි සමාගම පැත්තෙන් හඳුනා නොගෙන ගනුදෙනුකරුවන්ගේ පැත්තෙන් හඳුනා ගැනීම.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

**පරීක්ෂක යෝජනා:**

- පසුගිය ප්‍රශ්න පත්‍රවලට උත්තර ලියා පුරුදු පුහුණු වන්න.
- න්‍යායාත්මක පැතිකඩයන් ගැන දැනුමක් ඇතිකර ගැනීම සඳහා නිසිලෙස ස්ව-අධ්‍යයන පාඨමාලා පොත පරිශීලනය කිරීම.

## C කොටස

### ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්නයේ A **කොටසින්** නිපදනවාද, මිලදී ගන්නවාද යන්න තීරණය කිරීම පිළිබඳවද, B **කොටසින්** ඒකජ ප්‍රකමණ ක්‍රමය (linear programming) පිළිබඳ දැනුමද, පරීක්ෂාවට ලක්කර ඇත.

අයදුම්කරුවන් බොහොමයක් (A) සහ (B) **කොටස්** දෙකටම ඉතා හොඳින් උත්තර සපයා තිබුණේය. අයදුම්කරුවන් සුළු ප්‍රමාණයක් පමණක් මෙම සංකල්ප අවබෝධ කරගෙන තිබුණේ නැත.

සමහර අයදුම්කරුවන් පහත සඳහන් වැරදි සිදුකර තිබුණි:

(1) **(A) කොටසට** අදාලව ආන්තික පිරිවැය පිළිබඳ දැනුමක් නොමැති වීම.

(2) තීරණ ගැනීම සඳහා ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය සළකා බලා තිබීම.

(3) **(B) කොටසේ** විචල්‍යයන් සඳහා අරමුණු ශ්‍රිතය සහ සීමාකාරී සංරෝධක ප්‍රස්තාර ක්‍රමයට නොදැක්වීම.

(4) ශක්‍යතා කලාපය නිවැරදිව හඳුනා නොදැක්වීම.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

**පරීක්ෂක යෝජනා:**

- ස්ව-අධ්‍යයන පාඨමාලා පොතේ සියලුම උදාහරණ පුරුදු පුහුණු වන්න.
- සියලුම පෙරවැඩ පැහැදිලිව පෙන්විය යුතුය.
- පසුගිය ප්‍රශ්න පත්‍රවලට උත්තර ලියා පුහුණු වන්න.

### ප්‍රශ්න අංක 09

මෙම ප්‍රශ්නයේ (A) **කොටසින්** ව්‍යාපෘති ඇගයීම පිළිබඳ දැනුමද, (B) **කොටසින්** විචලනයන් ගණනය කිරීම සහ අයවැයගත සහ සත්‍ය දායකය සැසඳීමට මෙහෙයුම් ප්‍රකාශනයක් පිළියෙල කිරීම ගැන දැනුමද, පරීක්ෂාවට ලක්කර තිබේ.

අයදුම්කරුවන් සියලුදෙනාම වාගේ (A) සහ (B) **කොටස්** දෙකටම උත්තර ලියා ඉහළ ලකුණු ලබාගෙන තිබුණි.

අයදුම්කරුවන් බහුතරය (B) **කොටසේ (b) කොටස** සඳහා මෙහෙයුම් ප්‍රකාශනය නිවැරදිව ඉදිරිපත් කර තිබුණි.

සමහර අයදුම්කරුවන් පහත සඳහන් වැරදි සිදුකර තිබුණි:

<u>(A) කොටස</u>

(1) සමහර අයදුම්කරුවන් ප්‍රාග්ධන දීමනාව, වර්ෂ 4 වෙනුවට සම්පූර්ණ වර්ෂ 5 ටම සළකා බලා තිබුණි.

(2) ක්ෂය, මුදල් ගලාඒම් තුළ සටහන් කර තිබුණි.

(3) බදු ගණනය කිරීමේදී ප්‍රාග්ධන දීමනා සහ ක්ෂය ගලපා නොතිබුණි.

(B) කොටස

(1) සමහරු විචලනය අවාසි (A) හෝ වාසි (F) දැයි සඳහන් කර නැත.

(2) මිශ්‍රණ හා ඵලදා විචලනයන්ට අදාලව නිවැරදි සූත්‍රය ලියා නොතිබුණි.

(3) මිශ්‍රණ විචලනය ගණනය කිරීමේදී ප්‍රමිත මිශ්‍රණ / සත්‍ය මිශ්‍රණ යෙදවෙන්නේ කුමන අවස්ථාවේදිදැයි නිසි අවබෝධයක් නොමැති වීම.

(4) ඵලදා විචලනය ගණනය කිරීමේදී ප්‍රමිත භාවිත / මුළු භාවිත යෙදවෙන්නේ කුමන අවස්ථාවේදිදැයි ප්‍රමාණවත් අවබෝධයක් නොමැති වීම.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

**පරීක්ෂක යෝජනා:**

- සෑම විටම ඔබේ අමතර වැඩ පෙන්වන්න.
- පසුගිය ප්‍රශ්න පත්‍රවලට උත්තර ලියා පුරුදු පුහුණු වන්න.
- නිසිලෙස ඒ්ඒ්ටී ස්ව-අධ්‍යයන පොත පරිශීලනය කරන්න.
- නිවැරදි විචලන සූත්‍ර භාවිත කිරීම.

- - -

විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:

1. නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිප වතාවක් මනා අවධානයකින් කියවිය යුතු අතර, අවශ්‍ය තැන්වලදී පෙරවැඩ පැහැදිලිව පෙන්විය යුතුය.

3. ප්‍රශ්න වලට උත්තර සැපයීමේදී උපකල්පනයන් කර ඇත්නම් ඒවා පැහැදිලිව පෙන්විය යුතුය.

4. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

5. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

6. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා යෝජිත උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය. සමාන රටාවන්ගෙන් හා ව්‍යුහයන්ගෙන් යුත් ප්‍රශ්න නැවත නැවත විභාගයන්හිදී පරීක්ෂා කළ හැකි බැවින් මෙම ක්‍රමය අනුගමනය කිරීම වාසිදායකය.

7. ස්ව-අධ්‍යයන පාඩම්මාලා අධ්‍යයනය කිරීම හා එහි ඇති උත්තර පරිශීලනය කිරීම ඉතා වැදගත්ය.

8. මෙම විෂය සම්බන්ධව ඇති පොත්පත්, සඟරා හා ලිපි ආදිය පරිශීලනය කළ යුතුය.

9. විභාගයේදී කාලය මනාව කළමනාකරණය කර ගැනීම. එක් එක් ප්‍රශ්නයට වෙන්කර ඇති ලකුණු මගින් ඒ සඳහා වෙන්කළ යුතු කාලය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය.

10. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * -